“ඔබ අතරින් කිසිවෙකු හෝ වුළූ ධෝවනය කර පසුව සමෙන් සාදන ලද පාවහන් යුගල පැළඳ ඇත්නම්, ඔහු ඒ දෙක මත (මස්හ්) පිරිමදිත්වා. ඒ දෙක පැළඳ ගෙනම සලාත් කරත්වා. අනිවාර්යය ස්නානය හේතුවකින් මිස ඔහු කැමතිනම් ඒ දෙක නොගළවත්වා.”

සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අනස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “ඔබ අතරින් කිසිවෙකු හෝ
වුළූ ධෝවනය කර පසුව සමෙන් සාදන ලද පාවහන් යුගල පැළඳ ඇත්නම්, ඔහු ඒ දෙක මත (මස්හ්) පිරිමදිත්වා. ඒ දෙක පැළඳ ගෙනම සලාත් කරත්වා. අනිවාර්යය ස්නානය හේතුවකින් මිස ඔහු කැමතිනම් ඒ දෙක නොගළවත්වා.” [صحيح] [رواه الدارقطني]

මුස්ලිම්වරයකු වුළූ ධෝවනය කිරීමෙන් පසු ඔහුගේ පාවහන් දෙක ඔහු පැළඳ ගත්තේ නම්, ඉන්පසුව ඔහු කිලිටි තත්ත්වයට පත් වූ විටෙක, නැවත වුළූ ධෝවනය කිරීමට ඔහු සිතුවේ නම් ඔහු ඒ දෙක මත (මස්හ්) පිරිමැදිය යුතුය. ඒ දෙක පැළඳගෙනම සලාත් ඉටු කළ යුතුය. නියමිත කාලය තුළ ඒ දෙක ගළවා නොදැමිය යුතුය. නමුත් ඔහු අනිවාර්යය ස්නානය කිරීමේ තත්ත්වයක් උදා වූ විටෙක ඒ දෙක ගලවා ස්නානය කළ යුතුය.

https://sunnah.global/hadeeth/si/show/8392